# හා පැංචාගේ වීර චාරිකාව



මුතුලි නතාරා දසනායක

# හා පැංචාගේ වීර චාරිකාව


## මුතුලි නතාරා දසනායක

කතෘ


## පළමු දිග හැරිම

මහාමායා බාලිකා විදුහල

6 - D ශ්‍රේණිය

2025.02.22


**15BN - 978 - 624 - 208 - 611 - 8**

# පිදුම

**මගේ ආදර අම්මාට**


# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ජෙද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි. ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන “හෙරණගත්කරණී” ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

# හා පැංචා ගමනක් යයි



හා පැංචා එයාගේ චූටි ගෙදර අම්මයි සහෝදරයින් හතර දෙනත් එක්ක ජීවත් වුණා. එයා හිටිය ගෙදර පොඩි ගුලක් වගේ ලස්සන තැනක හැදුනු එකක් ගේ වටේටම ගස්වැල් වලින් වැහිලා තිබුණා. ලස්සන මල් පිපිලා තිබුණා. ඒ නිසා කාටවත් ඒ තැන හොයාගන්න බැරි වෙලයි තිබුණේ. මේ නිසා හා පවුල සතුටෙන් හොඳින් ජීවත් වුණා.

හා පැටව් එළියට ගියත් ඈතට ඇවිදින්න ගියේ නෑ කැලයේ මොන මොන අමුතු සත්තු ඉදියිද කියලා හරියට දන්නේ නැති නිසා හා අම්මත් ඒ ගොල්ලන්ට කලින්ම කියලා තිබුණා තමන්ගේ ගෙදර වත්තෙන් ඈතට යන්න එපා කියලා මොකද එයාට වැඩ ගොඩක් තිබුණු නිසා හැම වෙලේම පැටව් ගැන බලාගෙන ඉන්න බැරි වෙයි කියලා සිතුණු නිසා.

ඒ ගොල්ලෝ ජීවත් වුනේ ලොකු කැලයට මෙපිටින් පිහිටි පිට්ටනිය පැත්තේ මී වන වැනි පොඩි ගස් හා තණ කොළ වැවිලා තිබුණු ප්‍රදේශයක් ඒ ගොල්ලෝ සමග හිටිය ලොකු සත්තු ඒ ගොල්ලන්ට කියලා තිබුණේ ඈත තිබුනු විශාල වනාන්තරයේ නපුරු සත්තු හා අපි නොදන්නා අමුතුදේ ඇති නිසා ඒ පැත්තට යන එක හොදනැති බවයි.

ඉතින් පුංචි සත්තු මේ කතන්දර අහගෙන ඉඳලා ඒ පැත්තට යන්නවත් හිතුවේ නෑ.

''ඔන්න මම නම් ඒ පැත්තට යන්නවත් හිතන්නේ නෑ'' ලොකුම අයියා කිව්වා

''මටත් බෑ මම යන්නෙත් නෑ අනික් අයියත් කිව්වා අනිත් හැමෝට ඒ අදහසට එකඟ වුණත් පුංචිම හා පැටියාට ඈත ලොකු කැලයේ මොනවද තියෙන්නේ බලන්න ලොකු උවමනාවක් ඇති වුණා. එයා මුකුත් නොකියා කට වහගෙන හිටියා. හැබැයි එයා හිතා ගත්තා කවදා හරි ගිහිල්ලා ලොකු කැලයේ තියෙන අරුම පුදුම දේ බලන්න ඕනේ කියලා.

ඔන්න ඔහොම දින ගතවෙලා දවස් ගෙවී ගියා හා පැටව් ලොකු පැටව් වුණා. දවසක් මේ ගොල්ලෝ කෑම හොයාගෙන ගුහාවෙන් එළියට බැහැලා ටිකක් ඈතට ගියා හා අම්මා ඉස්සරහින් ගියා පැටව්

පිටිපස්සෙන් ගියා. ඒ ගොල්ලෝ කෑමට ආස කරන තණකොළ ජාති හොයාගෙන තමයි මේ කට්ටිය පිටත්වෙලා ගියේ.

පුංචි හා පැටියත් කල්පනා කරමින් ඉස්සරහට ගියා. එයා හිතුවා මම මොනවා හරි ලොකු දෙයක් කරන්න ඕනේ කියා. එයා දැන් හයියයි කලින්ට වඩා ඇඟ ලොකු වෙලා දුර ගමනක් යන්න පුළුවන්. හැම දාම එක විදිහට ගෙදරම හිර වෙලා ඉදලා එයාට එපා වෙලා තිබුණේ. මේ ඉන්න පැත්තෙන් ඈත ලෝකයක් ගැන ඒ ගොල්ලෝ දැන ගෙන හිටියේ නෑ ඉතින් ඒ ලෝකයේ මොනවද වෙන්නේ බලන්න ඒ පැත්තට යන්න වෙනවා කියන එක එයාට තේරුණා.

කෑම හොයමින් ඉදිරියට ගිය හා පවුලෙන් අයින් වෙලා එයා ලොකු කැලය පැත්තට යන්න පටන් ගත්තා. අයියලා කෑම කමින් සිටි නිසා ඒ ගොල්ලෝ මෙයා යන ගමන ගැන ඒතරම් බැලුවේ නෑ. හා පැංචාට කෑම ගැනත් අමතක වෙලා ඉක්මනින්ම කැලය දිහාවට ගමන් කරන්න ගත්තා. ලොකු ගස් අතු නිසා කැලේ අඳුරු ගතිය වැඩිවෙන්න ගත්තා කෑමට හැකි රස කෑම ජාති මේ කැලේ ඇති බව එයාට තේරුණා කැලයේ ඇති පුදුම දේ බැලීමටත් රස කෑම ජාති කෑමටත් කැමැත්තෙන් එයා තවදුරටත් ඉස්සරහට ගියා.

<u>හොඳ යාළුවෙක් ලැබුනා</u>



හා පැංචාට හරිම බඩගිනියි. එයා කෑම හොයාගෙන තව ඉස්සරහට ගියා. කැලේ හරිම ලස්සනයි. ලස්සන මල්, ගංගා, සත්තු ගොඩක් හා පැංචාට බලන්න පුළුවන් වුනා. එයාට හරිම සතුටුයි එයා මල් වටේ නට නට සින්දු කිව්වා, නැටුවා සත්තු එක්ක කතා කරා. එයාට තව තවත් කැලේ ඇතුලට යන්න හිතුනා. එයාට කෑමත් හම්බ වුණා බඩගිනි නැති වුණා.

දන්නෙම නැතුව හවස් වුණා. බඩගින්න නැති උනා සන්තෝසය වැඩිකමට හා පැංචා එයා දන්නේ නැති පළාතකට නොදැනම ඇවිත් තිබුණා. එයා ගං ඉවුරට ආවා ගං ඉවුරට ඈතින් තිබුණේ ලොකු ගස් වලින් සෑදුනු කැලයක් ලොකු ගස් නිසා ඉරේ එළිය වැටුණේ ටිකයි. එක එක වර්ගයේ ගස්ද අමුතු හැඩයේ මල්ද ඒ කැලයේ ගොඩාක් තිබුණා. අඳුර වැටීගෙන එද්දී හා පැංචාට කුරුල්ලන්ගේ හා වඳුරන්ගේ ශබ්ද අහන්න ලැබුනා. තවත් කැලේ ඇතුළට ගිය එයාට බය හිතුනා මේ වෙලාවේ කවුදෝ ගහක ඉඳන් එයා දිහා බලාගෙන ඉන්න බව එයාට දැනුනා හා පැංචා එයාට කතා කරා,

අනේ කවුද හැංගිලා මා දිහා බලාගන ඉන්නේ මට පාර වැරදිලා ඔයා මට උදව් කරනවාද? ඒත් සද්දයක් නෑ. එයා ඉස්සරහට යන්න ලෑස්තිවෙලා ආයෙත් වටපිට බැලුවා. එතකොට ගස් අස්සේ කවුදෝ කෙනෙක් තමන් දිහා බලාගන ඉන්න බව වැටහුනා.

ආ මේ වඳුරු පැංචෙක් නේ ඔයා අනේ මට උදව් කරනවද

වඳුර පැංචා අත්තෙන් බැහැලා එයා ළඟට ආවා

ඔයාට මොකද වුණේ? හා පැංචෝ එයා ඇසුවා

බඩගින්නට කෑම හොයාගෙන කැලේට ආපු මම අතරමං වුණා හා පැංචා කිව්වා. අම්මයි අයියලා එක්ක හිටපු මම ඒගොල්ලෝ එක්ක ඉන්නේ නැතුව විශාල කැලේ පැත්තට ආවා ඒ ගොල්ලන්ගේ කීම අහන්නේ නැතුව කැලේ ඇතුලට ගියා. එකක් මට රස කෑම කැලේ ඇති කියලා හිතුනා අනිත් එක තමයි පොඩි වීර වැඩක් කරන්න මගේ හිතේ තිබුණු ආසාව හා පැංචා වඳුරු පැංචාට කිව්වා.

දැන් අපි මොකද කරන්නේ වඳුරු පැංචා ඇසුවා. මම නම් රෑට ගහක අත්තකට වෙලා ගුලි වෙලා නිදාගන්නවා. මගේ අම්මයි අනිත් අයයි අන්න අර ගස්වල අතු උඩට වෙලා ඉන්නවා. ඔයාට ඉතින් ගස් නගින්නත් බෑ නේද? රෑට මේ කැලේ නපුරු සත්තු ඉන්නවා. ඒ ගොල්ලෝ කෑම සොයා ගෙන හැම තැනම ඇවිදින්නේ රෑටයි. ඒ නිසා ඔයාට පරිස්සම් වෙලා ගොඩක් හරි ගස් බෙනයක් හරි ඇතුලට රිංගලා සද්ද නැතුව ඉන්න වෙනවා. ඒ අදහසට හා පැංචා කැමති වුණා. එයාට වෙන කරන්න දෙයක් තිබුනෙත් නෑ.

එහෙනම් අපි ගුලක් හරි හැංගෙන්න හොඳ තැනක් හරි හොයා ගමු එයා වදුරු පැංචාට කිව්වා.

ඉතින් මේ දෙන්නා අඳුරු වැටීගෙන එන වනයේ තවත් ඉස්සරහට යන්දී ඒ ගොල්ලන්ට ගල් ගොඩක තිබුනු ගුලක් වගේ වැහිච්ච පොඩි ගුහාවක් හම්බ උනා.

අද රෑ ඔයා මෙතන ඉන්න මම උදේම ඔයාව බලන්න එන්නම් ඊට පස්සේ කැලේ ඉස්සරහට ඇවිදලා ඔයා දැකලා නැති ලස්සන තැන් මම පෙන්නන්නම් වඳුරු පැංචා පොරොන්දු වුණා. හා යාළුවා බයෙන් බයෙන් ගුල ඇතුලට වෙලා වඳුරු පැංචා හෙට උදේ එන තුරු එතන ඉන්න බව කිව්වා.

එන්න එන්නම අඳුරු ගතිය වැඩිවුණා. හා පැංචා බයට පත්වුණා. රෑ මැද කැලයෙන් ඇසෙන නපුරු හඬවල් වැඩිවුණා. මෙතෙක් කල් හා පැංචා අහලා නැති සතුන්ගේ ගෙරවීම් හඬද, ගොඳුරු හොයාගන යන කැලේ සත්තු ගොදුරට පැන කෑ ගහන හැටි නිසා හා පැංචාට නින්ද නම් ගියේ නෑ.



එයා හොරෙන් බෙල්ල එළියට දාලා බලනකොට හඳ එළිය වැටී කැලය එළිය වී තිබෙනු දැක්කා ඈත තිබුණේ හඳ එළියේ දිලිසෙමින් තිබුණු විලක් ඒකෙ නොයෙක් ලොකු සත්තු පීනමින් සිටිනු පෙනුණා. මේ නම් හා පැංචා කවදාවත් දැකලා නොතිබුණි අමුතුම සත්තු ඒ ගොල්ලෝ ලොකු සත්තු බව එයාට පෙනුනා. ඒකේ හිටිය සමහර සතුන්ට ලොකු කොරපොතු තිබුණා සමහරුන්ට දිග බෙල්ලක් තිබුණා. ගැඹුරු නැති ඒ විලේ සමහර විශාල සත්තු වතුරේ ගිලි එක තැනට වී හිටියා.

එතකොට ලොකු ගොරවන හඬක් එක්ක පොළව දෙදරවමින් විශාල උල්දත් සහිත කට ඇරගෙන ලේ පෙරමින් ආ ලොකුම ලොකු සතෙක් ඊට කුඩා සතෙකු එයාගේ ගොදුර හැටියට අල්ලා ගත්තා. එහාට මෙහාට

දඟලමින් පොඩි සතාව පොළොවේ ගසා මරලා දැම්මා ලොකු සතා උෟ ගොදුර වශයෙන් අරගෙන කැලයට ගියා.

හා පැංචාට නම් නින්දක් නෑ. මේ භයානක, අමුතු කැලය මේ මගේ වෙයි කියලා එයා නම් හිතුවේ නෑ. ඉන්පසු එයාට නින්ද ගියා ඒත් එයාට මුළු රෑම සැපට නිදාගන්න නම් ලැබුණේ නෑ කැලේ මෙතරම් පුදුමාකාර තැනක් බව හා පැංචාට දැනගත්තේ එදා රෑ එයා ආපු වීර චාරිකාව ගැන අම්මාටත් සහෝදරයන්ටත් කියන්න හා පැංචාට බයත් හිතුනා

ඉතින් අනිත් දවස උදාවුනා හා පැංචා කැලයේ ලස්සන දැක්කේ එවෙලේ තමයි ගස්වල අතු අතරින් ඉර එළිය ගලාගෙන ආවා සිසිල් සුළං හමා ගියා පිරිසිදු වාතාශ්‍රය නිසා හා පැංචාට අළුත් බවක් දැනුනා එයාට කෑමට කොළ ජාති, අහල පහළ පිරිලා තිබුනා ඒ නිසා එයාට බඩගින්නේ නම් ඉන්න වුණේ නෑ රෑට තිබුණු අමුතු සද්ද අහන්නවත්, මස් කන සත්තු දකින්නවත් ඒ උදේ කාලයේ නම් ලැබුණේ නෑ.

ඔන්න ඒ වෙනකොට රිලා පැංචා ගස් අතරින් මතු වුණා. එයා රසවත් පළතුරක් කමින් හිටියා අද අපි කැලේ බලන්න යමු නේද? එයා පැංචාට කිව්වා.

''හා හොඳයි. හා පැංචාත් එක පයින් කැමති වුණා.

ඉතින් ඔහොම යනකොට ඒ ගොල්ලොන්ට ගස් අතු අතර සිටින ලස්සන යෝධ කුරුල්ලන් දක්නට ලැබුණා. මේ කුරුල්ලන් පළතුරු කන අයද මස් කන අයද බව දැන නොසිටි නිසා හා පැංචා පරිස්සමින් තමයි ගමන් ගියේ රිලා පැංචා නම් ගස්වල අතු අතරින් පැන ගිය නිසා එයාට නම් හැංගෙන්න ඕන තරම් තැන් තිබුණා.

ඔන්න ඉස්සරහට යනකොට මේ දෙන්නට ලස්සන ගංගාවක් හම්බ වුණා එහි පාට පාට මාළුන් ගොඩක් පීනමින් හිටියා මේ ගංගාවට උඩින් ලස්සන මල් ආරුක්කුවක් හැඩේට හැදිලා තිබුණා. එය හරියට ලස්සන ලෝකයකට යන පාරක් වගේ. යාළුවෝ දෙන්නාට හරිම සතුටුයි. මේ පැත්තේ හිටිය සත්තුත් මේ දෙන්නා එක්ක යාළු වුනා ඒගොල්ලෝ වැඩිය අමුත්තන් දැකපු අය නොවන බව පෙනුනා.

දැන් යාළුවො දෙන්නට හරිම මහන්සියි. ඒ දෙන්නා දිය පාර ලඟ ඉදගන ගිමන් හැරියා ආපසු හැරී ගෙදර එන්න පිටත් වෙන්න කාලය හරි බව හා පැංචාට තේරුණා රිලා යාළුවා එයාගෙන් වෙන් වෙලා රිලා රංචුව ළගට ගියා.

# වලස් හාමිගේ කරුණාව

කැලෑවේ තවත් ඉස්සරහට යනකොට එයා වතුර වලක් ලග සිටින කිඹුලන් ගොඩක් දැකල බය වුණා. බයවෙලා දුවගෙන යනකොට ගුහාවක් වගේ තැනක් දැකලා ඇතුලට ගියා. ගුහාව ඇතුලේ විශාල වලහෙක් නිදියගන හිටියා හා පැංචා දුවගෙන ආපු සද්දෙට එයා නැගිටලා ගොරවන්න ගත්තා හා පැංචා බයෙන් වෙව්ල වෙව්ල හිටියා

''අනේ මට කරදර කරන්න එපා මම පුංචි හා පැටියෙක්'' හා පැංචා කිව්වා

හරි ඔයාට මොනවද ඕනේ ඇයි මේ නපුරු කැලේට ආවේ වලහා ඇහුවා මට ඕනෑ වුණේ කැලේ ලස්සන බලන්න කැලේ තියෙන පුදුම දේවල් බලන්න. ඒකයි මම කැලේට ආවේ.

''අනේ පුංචි හා පැටියෝ මේ කැලේ ඉන්නවා හොඳ සත්තු වගේම නපුරු සත්තුත් ඒ නිසා ඔයාට පරිස්සම් වෙන්න වෙනවා එයා කිව්වා

මෙතනින් ඉස්සරහට ගොඩක් දුර ගියාම ලොකු ගස් තියන කැලය හම්බවෙනවා. ඒකේ ලොකු මඩ වගුරක් තියෙනවා. ඒ පැත්තට යන්න අමාරුයි. නපුරු සත්තු මහ ගොඩක් මේ කැලේ ඇතුලේ හැංගිලා ඉන්නවා. කවුරු හරි මේ පැත්තට ආවොත් මේ සතුන් එළියට ඇවිත් ඔයාව කයි ඒ නිසා ඒ පැත්තට යන්න එපා වලසා කිව්වා.

''අද රෑ මේ ගල් ගුහාවේ නැවතිලා ඉඳලා හෙට උදේම ආපසු ගෙදර යන්න ඒක තමයි හොඳ කැලේ ලස්සන උනාට ඒකේ නපුරු දේවල් මහ ගොඩක් තියෙනවා වලහා කිවුවා

මේ වගේ හොඳ යාළුවොත් කැලයේ ඇති බව හා පැංචාට තේරුනා හැබැයි නපුරු සතුන් ගැන කිව් දේ එයා වැඩිය විශ්වාස කළේ නෑ. ඉතින් ඒ ගැන තේරුණු නිසා වලසා ආපසු කැලේ නරක දේ ගැන කතාව පටන් ගත්තා.

මගේ සීයා කියලා තියනවා මේ කැලේ ඇතුලේ ලොකුම ලොකු මිනිස්සු වගේ වදුරන් වැනි සත්තු කට්ටියක් ඉන්න බව ඒ ගොල්ලොන්ට හයිය අන් තියෙනවා කියලා කිව්වා ඉක්මනට පැන පැන යන්න පුළුවන් කිව්වා ඔයා කැලේ ඇතුලට ගියොත් ඔයාව අල්ල ගනීවි. ඒ ගොල්ලෝ ගස් උඩ අතු අස්සේ හැංගිලා ඉන්නවා, හැබැයි ඒ ගොල්ලන්ට හයියෙන් අපේ පස්සෙන් පන්නගෙන එන්න පුළුවන්ලු ඔයා පරිස්සම් වෙන්න ඕනෙ ඒ නිසයි.

'' මට හරි ආසයි ඒ ගොල්ලෝ බලන්න යන්න'' හා පැංචා කිව්වා.

''ඒක මේ ඔයා හිතන විදිහේ සෙල්ලම් වැඩක් නොවෙයි. බොහෝම කරදර වෙන්නපුළුවන් හැකි වැඩක්'' වලසා කිව්වා. ඒත් හා පැංචාට මේ කතාවේ අමාරු කම තේරුනේ නෑ එයා හිතා ගත්තා තවත් කැලේ ඉස්සරහට යන්න. එයා හිතුවේ හැමෝම සත්තු හොඳ යාළුවෝ කියලා කොහොම හරි තාමත් එයාට හම්බුනේ හොඳ යාලුවන් තමයි. ඒ ගැන හිත හිත එයා ගුලඇතුලට වෙලා ගුලි ගැහිලා නිදාගත්තා.

පසුවදා පාන්දරම හා පැංචා ගුහාවෙන් එළියට ගියා වලසා තවමත් නිදිද කියා බලලා හා පැංචා ලොකු වඳුරන් සොයාගෙන ගියා. එයා හිතුවේ ඒ නපුරොත් එයාට හමුවුණ වඳුරු පැංචා හා වලස්හාමි වගේ හොඳ අය කියලා. එයා කාටත් හොරෙන් ලොකු වඳුරු රංචුව මුණගැසීමට ගියා. කැලයේ ඇතුලේ ඇවිදගන යන විට එයාට තවත් බය හිතෙන ශබ්ද ඇහුනා එකපාරටම ලොකු සතෙක් එයාගේ ඉස්සරහට පැනලා හා පැංචාව අල්ල ගත්තා.

'' අනේ මාව බේරගන්න ! අනේ මාව බේරගන්න හා පැංචා කෑ ගැසුවා.

''දඟලන්න එපා ඔයාට බේරෙන්න වෙන්නේ නෑ''.

එයාව අල්ලාගෙන සිටි කළු ලොම් වලින් පිරිච්ච නපුරු සතා සැරෙන් කිව්වා මම ඔයාව මගේ යාළුවා කොටි හාමිට භාර දෙනවා. එතකොට එයා මට අල ජාති, ගෙ ඩි ජාති ගෙනත් දෙයි.'' හා පැංචාව

අල්ලාගෙන තිබුනේ වඳුරු රංචුවේ එක් ලොකු වඳුරෙක් එයා කෑම හොයාගන්නේ මේ වගේ අහිංසක සත්තු කොටි හාමිට අල්ලලා දීලා. ටික දුරක් යන විට එකපාරටම කවුරු හරි කෙනෙක් වදුරාට ගහලා හා පැංචාව බේරගත්තා බලනකොට ඒ වලස්හාමි. වඳුරාගෙන් ගැලවුණු පසු වළස්හාමි හා පැංචවත් රැගෙන ගුහාවට ගියා. ඊට පස්සේ වලස්හාමි හා පැංචාට අවවාද ගොඩක් දුන්නා.

''හා පැංචාට මම කිව්වා නේද මේ කැලේ නපුරුතැනක් කියලා. මම කිව්වා නේද මේ කැලේ ඉන්න හැමෝම හොඳ නෑ කියලා. මීට පස්සේ මේ වගේ හිතුවක්කාර වැඩ කරන්න එපා හා පැංචාද වලස්හාමිගේ අවවාද පිළිගත්තා.

මට සමාවෙන්න වලස්හාමි මම ආයේ කවදාවත්ම මේ වගේ හිතුවක්කාර වැඩ කරන්නේ නෑ.


# නැවත ගෙදර ඒම

දැන් නම් ආපු දුර හොඳටම ඇති. ඒ නිසා එයා ආපසු ඒමට හැරුනා. මේ පොඩි වයසට එයා වනාන්තරේ දැක්ක දුටු දේ හරිම අපූරුයි. මෙයාගේ කුතුහලය නිසා මහා කැලයට ඇවිත් මුහුණ දෙන්න සිදුවුනු දේවල් හරිම පුදුමයි.

පුංචි ළමයි වැඩිහිටියෝ කියන දේ අහන්න ඉගෙන ගන්න ඕනේ බව මට තේරුණා  මගේ අම්මා මට ඈතට යන්න එපා කිව්වේ මට කරදරයක් වෙයි කියලා එයා දන්න නිසා කියලා හා පුංචාට තේරුණා.

පසුදා උදෑසන හා පුංචාව වලස් යාළුවා නැවත එයාව කැලේ මායිමට ඇරලුවා හොඳ යාළුවෙක් ලැබීම නිසා හා පැංචා කරදර වලින් ගැලවුණා. මේ දෙන්නා එකතු වී වැඩ කිරීම නිසා හා පැංචාට නැවත තමාගේ ගමට කරදරයක් නැතුව එන්න පුළුවන් වුණා. තමා දැක්ක දේ අම්මටයි සහෝදරියටයි කියන්නඑයා බොහෝම කැමැත්තෙන් තමයි හිටියේ ගෙදර ලගට එන කොට එයාට වැටෙන්න තරම් මහන්සියි. කතා කර ගන්නවත් බෑ අනේ මට මේ මොකද උනේ ආයේ නම් අම්මා කියන දේ අහනවා එපා කියන දේ කරන්නේ නෑ අනේ අනේ මට උනු දේ කියලා හිත හිත එයා ගේ පැත්තට ගාට ගාට ආවා අන්න අම්මා එළියේ වැඩ කර කර ඉන්නවා එයාට හරි සතුටුයි අම්මා හා පැංචා දැක්කා ගමන් දුවගෙන ඇවිත් එයාව අල්ල ගත්තා. අනේ ඔයාට මොකද උනේ දරුවෝ එන්න අපි ගෙට යමු කියලා එයාව එක්කගෙන ගියා.

එයාගේ කතාව කියන්න හා පැංචා බලාගෙන හිටියත් ගමන් මහන්සිය නිසා එයාට හොඳටම නින්ද ගියා.



නිමි..



# මුතුලි නතරා දසනායක

කතෘ

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.
මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.
මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත්න මහලේකම්

**15BN - 978 - 624 - 208 - 611 - 8**